මැදදුම්බර ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය
------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 14 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | පරිත්‍යාග ලෙස ලැබී තිබුණු වත්කම් 2 ක වටිනාකම හා කාර්යාල උපකරණ 2 ක වටිනාකම රු.69,407 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුවේ. | පිළිගනිමි. |
| (ii) | වියදම් ණයහිමියෝ හා රු.77,915 ක් වැඩියෙන්ද කර්මාන්ත ණයහිමියෝ වටිනාකම රු.48,344 ක් අඩුවෙන් ද ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුවේ. | පිළිගනිමි. |
| (iii) | ඉඩම් හා ගොඩනැගිලි රු.168,234 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුවේ. | පිළිගනිමි. |
| (iv) | කර්මාන්ත ණයගැතියෝ රු.1,469,937 ක් වැඩියෙන්ද ලැබිය යුතු රු.400,000 ක ණයගැතියෝ අඩුවෙන්ද දැක්වුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුවේ. | පිළිගනිමි. |

(ආ) ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වසර 5 කට වඩා වැඩි ලැබිය යුතු ශේෂවල වටිනාකම රු.14,567,082 ක් විය. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම වටිනාකම්වලට අදාළ සංවර්ධන ව්‍යාපෘති වල මේ වන විට සැලකිය යුතු ප්‍රමාණයකින් මුදල් ලැබී ඇති බව දන්වමි. |

(ඇ) ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වසර 5 ක කාලයක් ඉක්මවූ ගෙවිය යුතු ශේෂ රු.1,869,447 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | සංවර්ධන ව්‍යාපෘතිවල මේ වන විට සැලකිය යුතු ප්‍රමාණයකින් මුදල් ගෙවා ඇති අතර, එයට අතරැදි මුදල් ඉල්ලීම් නොකර ඇති කර්මාන්තද පවතින බව දන්වා සිටිමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වටිනාකම රු.47,147,341 ක් වූ ගිණුම් විෂයයන් 8 කට අදාළව තොග ලේඛනය, උපලේඛන හා තුලනය කරන ලද තැන්පත් ලේඛන යනාදි සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූලාශ්‍ර ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කෙරෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | පිළිගනිමි. |

1.4 අනුකූල නොවීම

--------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-------------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණකාධිකාරීගේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (vii) (ඊ) වගන්තිය හා 2016 දෙසැම්බර් 13 දින ප්‍රකාශයට පත්කරන ලද ගැසට් පත්‍රය | දැන්වීම් පුවරු 46 කින් රු.53,887 ක් අයකර ගැනීමට තිබුණි. | වර්ෂය ආරම්භයේ සමීක්ෂණය කර ගාස්තු අය කිරීම කළ යුතුවේ. | දැන්වීම් පුවරු සමීක්ෂණයක් සිදු කර ඇති අතර හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | 2016 මාර්තු 17 දිනැති අංක 2016/03 දරන මධ්‍යම පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 10 වගන්තිය | කඩ කාමර 9 ක් අතුරු බදු දී තිබුණි. | අතුරු බදු දුන් කඩ කාමර සභාවට පවරා ගෙන චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුවේ. | කඩ කාමර 9 න් 5ක අතුරු බදු ලබා දී නොමැති අතර, වෙනත් පුද්ගලයින් මෙම කඩවල සේවයට යොදවා ඇති බව දන්වමි. ඉතිරි කඩ කාමර 4 සම්බන්ධයෙන් පරීක්ෂා කර වාර්තා කරමි. |
| (ඇ) | මු.රෙ. 371(2)(ආ) තත්කාර්ය අතුරු අග්‍රිමය | රු.160,728 ක අත්තිකාරම් ශේෂයක් නිරවුල් කර නොතිබුණි. | අත්තිකාරම් අදාළ කාර්යය නිමවූ විගස නිරවුල් කළ යුතුවේ. | පිළිගනිමි. |

2. මූල්‍ය සමාලෝචනය

-------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

-------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,383,727 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,711,330 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

-------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2018<br>ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017<br>ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,615,024 | 3,693,815 | 4,533,420 | 2,734,289 | 3,756,802 | 3,855,960 | 4,007,323 | 3,182,497 |
| (ii) | කුලී | 2,337,626 | 2,598,674 | 3,327,988 | 1,896,747 | 2,771,989 | 1,971,998 | 1,748,857 | 3,593,541 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,073,600 | 3,141,886 | 3,076,836 | 3,079,836 | 2,784,915 | 2,810,049 | 2,808,799 | 60,350 |
| (iv) | වෙනත් ආදායම් | 474,100 | 549,600 | 610,580 | 750,630 | 404,580 | 484,560 | 181,040 | 1,812,060 |
| | | 9,500,350 | 9,983,975 | 11,548,824 | 8,461,502 | 9,718,286 | 9,122,567 | 8,746,019 | 8,648,448 |

### 2.2.2 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු.18,632,423 ක් වුවද, වර්ෂය තුළ රැස් කරන ලද ආදායම රු.11,548,824 ක් වීමෙන් ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 62 ක් විය. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | පිළිගනිමි. |

### 2.2.3 උසාවි දඩ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.879,086 ක් විය. | අදාළ මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ----------------------- | ------------- | ----------------------- |

(අ) අතුරු ව්‍යවස්ථා
------------------

| | | |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් කාරණා 19 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | සභාවට ආදායම් උපයාගතහැකි අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් උපයා ගැනීම කළ යුතුව. | පිළිගනිමි. |

(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ (out come) ලබා නොගැනීම
---------------------------------------

| | | |
| --- | --- | --- |
| 2017 වර්ෂයේදී රු.1,991,802 ක් වැයකර ළමා උද්‍යානයේ වැසිකිළියක් හා රු.874,437 ක් වැයකර ළමා උද්‍යානයක් ඉදිකිරීමට බැම්මක් ඉදිකර තිබුණද, එය නිෂ්කාර්යව පැවතුණි. | වත්කම්වලින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට කටයුතු කර ඇති අතර, ළමා උද්‍යානය සකස් කිරීමට කටයුතු සූදානම් කර ඇති බව දන්වමි. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
----------------------------------

| | | |
| --- | --- | --- |
| ප්‍රදේශයේ එකතුවන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයට යොමු කිරීමෙන් තොරව පරිසරයට හානිවන අයුරින් බැහැර කර තිබුණි. | පරිසරයට හානි නොවන ලෙස කසළ කළමනාකරණය කළ යුතුවේ. | දිරන කසළ කුණ්ඩසාලේ කොම්පෝස්ට් අංගනයට ලබාදෙයි. නොදිරන කසළ උඩිස්පත්තුව හා මැදමහනුවර කසළ වෙන් කිරීමේ මධ්‍යස්ථාන දෙකක් ඉදිකිරීමේ කටයුතු කරමින් පවතී. |

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක
------------------------------

| | | |
| --- | --- | --- |
| සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟා කර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාවේ ඉඩම්වල අනවසර වෙළඳකුටි පවත්වාගෙන යාමට ඉඩ සලසා තිබුණි. | ප්‍රාදේශීය සභාව සතු ඉඩම් සභාවේ කාර්යයන් සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ප්‍රතිපූර්ණය කරගත යුතු රු.280,853 ක මුදල සභා අරමුදලෙන් ගෙවීම් කර තිබුණි. | මුදල් සභාවට ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුවේ. | නඩු අංක P/15/14 මඟින් වාරණ නියෝගයක් පනවා ඇති බැවින් එම මුදල ගෙවන ලදී. 2015.11.21 ප්‍රාදේශීය ලේකම් විසින් මෙම ව්‍යාපෘතිය නොනිමි බව පවසා ගෙවීම් ප්‍රතික්ෂේප කරන ලදී. |
| (ඇ) | 2018 වර්ෂයේ විශේෂ ආර්ථික යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ රැකියා විරහිත ප්‍රජාව සඳහා පුහුණුව සමඟ මහන මැෂින් 124 ලබා දීම සඳහා රු.3,500,000 ක් වැයකර තිබුණද, ස්වයං රැකියාවල නිරතවී නොතිබුණු බැවින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ පරමාර්ථය ඉටු වී නොතිබුණි. 2017 වර්ෂයේදීද ස්වයං රැකියා වැඩිදියුණු කිරීම සඳහා රු.2,000,000 ක වියදම් දරා මැෂින් 71 ක් ලබා දී තිබුණු අතර, ඒවායේ සාර්ථකත්වය පරීක්ෂා නොකර දෙවන වරද මැෂින් ලබාදී තිබුණි. | වැඩසටහන් ප්‍රතිඵලදායකද යන්න පසු විපරම් කිරීමට ස්වයං රැකියා ව්‍යාපෘතිවල සාර්ථකත්වය පිළිබඳව පසු විපරම් කර ව්‍යාපෘතිය සාර්ථක කිරීමට කටයුතු කළ යුතුවේ. | ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභී නාමලේඛනය අදාළ මන්ත්‍රීවරුන් විසින් ලබාදී ඇත. මේ සඳහා ප්‍රාදේශීය සභාව සම්බන්ධ වී නොමැති අතර ගරු මන්ත්‍රීතුමන්ලාගේ ප්‍රතිලාභී ලේඛනයට මැෂින් ලබා දීම සිදුකර ඇත. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | තනතුරු 10 ක පුරප්පාඩු 17 ක් හා තනතුරු 2 කට අදාළව අතිරික්ත 3 ක් පැවතුණි. | අතිරික්ත සේවකයන් සඳහා අනුමැතිය හා පුරප්පාඩු පුරවා ගැනීමට | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| | | කටයුතු කළ යුතුවේ. | |
| (ආ) | ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 22 ගෙන් රු.1,519,761 ක ණය ශේෂ අයකර ගැනීමට තිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | වර්තමානය වන විට ශේෂය අඩු වී ඇත. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | උඩිස්පත්තුව පොළ පිහිටි ගොඩනැගිල්ලේ කඩ කාමරයක් බදු දීමට කටයුතු නොකිරීම හේතුවෙන් රු.240,000 ක ආදායමක් අහිමි වී තිබුණු අතර, තක්සේරු කර නොතිබුණු පහළ මහල නිෂ්කාර්යව පැවතුණි. | තක්සේරු බදු කුලී අයකර බදු දීමට කටයුතු කළ යුතු වේ. | තුන්වරක් ටෙන්ඩර් කළද බදුකරුවෙකු ඉදිරිපත් නොවීම නිසා 2018 සැප්තැම්බර් 27 දින පුහුණු මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා මහා සභා යෝජනා අනුමත කරගෙන ඇති බව දන්වමි. |
| (ආ) | ආර්ථික මධ්‍යස්ථානයේ හිඟ කඩ කුලී රු.1,155,922 ක් වූ අතර, කඩ 8 ක හිඟ කඩ කුලිය රු.409,598 ක් විය. එම කඩ අතුරු බදු දීමෙන් බාහිර පාර්ශවයක් විසින් රු.1,760,000 ක් උපයා තිබුණි. | කඩ කාමර හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කිරීම හා අතුරු බදු සම්බන්ධයෙන් නීති, රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | කඩ කාමර 9 න් 5 ක් අතුරු බදු ලබා දී නොමැති බව ලිඛිතව දන්වා ඇති අතර, ඉතිරි බදුකරුවන් සඳහා ගිවිසුමේ 17 වන වගන්ති ප්‍රකාරව එම ගිවිසුම් අවලංගු කිරීමට කටයුතු යොදා ඇති බව දන්වමි. හිඟ අය කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සභාව සතු ඉඩම් තක්සේරු නොකර බදු දී තිබුණු අතර, බදුකරුවන් 10 දෙනෙකුගෙන් මාස 8 සිට අවුරුදු 09 ක් දක්වා කාලයකට කුලිය රු.468,815 ක් හිඟව පැවතුණි. | තක්සේරු බදු කුලිය අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | රු.92,000 ක් අයවී ඇති අතර ඉතිරිය අයකර ගැනීම සඳහා නඩු පවරා ඇති බව දන්වමි. |
| (ඈ) | සභාව සතු සතිපොළ ගවමස් කඩ හා මාළු කඩ හිඟ බදු ශේෂය රු.1,081,396 ක් විය. | 2009 සිට එන ශේෂයක් බැවින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන හෝ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |

3.5 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) රු.600,000 ක් වටිනා ජීප් රථය වසර 5 ක් නිෂ්කාර්යව පැවතුණු අතර තවත් වාහන 5 ක් ඌන උපයෝජිතව පැවතුණි. | වෙන්දේසි කිරීමට හෝ අලුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |
| (ආ) රු.24,928,666 ක් වටිනා මෝටර් ග්‍රේඩරය නිෂ්කාර්යව පැවතුණි. | මෙම වත්කම් උපයෝජනයට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |

3.6 ප්‍රසම්පාදනය

ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රසම්පාදන සැලැස්මක් සකස් නොකර රු.34,347,856 ක ප්‍රාග්ධන වියදම් දරා තිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | පිළිගනිමි. |

04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වැය විෂයයන් 24 කට අදාළව ඇස්තමේන්තු කරන ලද රු.1,979,600 ක ශුද්ධ ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | තාත්වික අයවැයක් පිළියෙල කළ යුතුවේ. | පිළිගනිමි. |